# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2024 මාර්තු මස 22 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2024.03.22 දින නිකුත් කරන ලදී)**

## සේවක අර්ථසාධක අරමුදල (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ එම වගන්තියේ (1) වන ඡේදයේ (උෟ) උපඡේදය මගින් පළකරනු ලැබිය යුතු බවට නියමකර ඇති තොරතුරු ප්‍රමාණවත් ලෙස සහ කාලීනව පළකිරීම සහ හෙළිදරව් කිරීම සහතික කිරීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් 5 වන වගන්තියේ (1) වන ඡේදයේ (උෟ) උපඡේදයට කරනු ලබන සංශෝධන සඳහා අනුරූප වන උපලේඛන ඇතුළත් කරනු ලබයි.

# සේවක අර්ථසාධක අරමුදල
## (සංශෝධන)

### 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2024 අංක      දරන සේවක අර්ථසාධක අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 5 වන වගන්තියේ (1) වන ඡේදයේ (ඌ) උපඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ප්‍රතියෝජනය කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — 1958 අංක 15 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

"(ඌ)

(i) සෑම එක් එක් වර්ෂයක් සඳහා ම අරමුදල සම්බන්ධයෙන් වූ ලැබීම් සහ ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක්, ආදායම සහ වියදම පිළිබඳ ප්‍රකාශයක් සහ වත්කම් සහ වගකීම් පිළිබඳ ප්‍රකාශයක් සකස් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතුය; සහ

(ii) සෑම එක් එක් මාසය සඳහා ම අරමුදල සම්බන්ධයෙන් වූ ආයෝජන පිළිබඳ ප්‍රකාශයක් සකස් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එම ප්‍රකාශය පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනයට වඩා වැඩි නොවන දිනයක දී අරමුදලේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය; එම ආයෝජන පිළිබඳ ප්‍රකාශයේ අදාළවන පරිදි, මේ පනතේ පළමු උපලේඛනයේ නියම කර ඇති ආකෘතියෙන් එක් එක් ආයෝජනයේ ප්‍රමාණය, නාමික අගය, ගැනුම් මිල සහ වෙළෙඳපළ අගය ඇතුලු අරමුදලේ ආයෝජනය කරනු ලැබූ සුරැකුම්පත්වල ස්වභාවය සහ වෙනත් අදාළ තොරතුරු පැහැදිළිවම සඳහන් කරනු ලැබිය යුතු ය; සහ

(iii) සෑම එක් එක් මාසය සඳහා ම අරමුදල සම්බන්ධයෙන් වූ බැහැර කිරීම් පිළිබඳ ප්‍රකාශයක් සකස් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එම ප්‍රකාශය පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනයට වඩා වැඩි

නොවන දිනයක දී අරමුදලේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය. එම බැහැර කිරීම් පිළිබඳ ප්‍රකාශයේ අදාළවන පරිදි, මේ පනතේ දෙවන උපලේඛනයේ නියමකර ඇති ආකෘතියෙන් එම එක් එක් බැහැර කිරීමේ ප්‍රමාණය, නාමික අගය, බැහැරකිරීමේ ප්‍රතිෂ්ඨාව (විකුණුම් මිල) සහ වෙළෙඳපළ අගය, උපචිත වූ ඉපයීම් හෝ පාඩු ඇතුළු අරමුදලින් බැහැර කරන ලද සුරැකුම්පත්වල ස්වභාවය සහ වෙනත් අදාළ තොරතුරු පැහැදිලිවම සඳහන් කරනු ලැබිය යුතුය; සහ

(iv) අරමුදල පිළිබඳ වාර්ෂික වාර්තාවේ ආයෝජන සහ බැහැර කිරීම් පිළිබඳ මාසික ප්‍රකාශයන් පළකරනු ලැබිය යුතු ය; එසේ වුව ද, අදාළ වර්ෂය සඳහා වූ ප්‍රකාශයන් නැවත ඉදිරිපත් කිරීමට නොහැකි වන තරමට පරිමාධික බවට තීරණය කරනු ලබන අවස්ථාවක දී, අරමුදලේ වෙබ් අඩවියේ එම මාසික ප්‍රකාශයන් අධි සන්ධානයක් පැවතීම මෙම නියම කිරීමට ප්‍රමාණවත් ලෙස අනුකූලව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(v) සමුච්චිත ඉපයීම් සහ අදාළ මාසයට පෙරතුවම වූ මාස දොළහක කාලසීමාව සඳහා වූ ස්වකීය සුරැකුම්පත් ආයෝජන ඉපයීම් ප්‍රමාණය පෙන්නුම් කරමින් අරමුදල සම්බන්ධයෙන් සෑම එක් එක් මාසය සඳහා වූ වාර්තාවක් සකස් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එම වාර්තාව පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනයට වඩා වැඩි නොවන දිනයක දී අරමුදලේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය; මේ වගන්තියේ කාර්ය සඳහා "ඉපයීම" යන්නෙන් ආයෝජනය මත වූ ප්‍රතිලාභ අනුපාතිකය අදහස් වේ; සහ

(vi) මෙම සංශෝධනය බලාත්මක වන අවස්ථාවක දී හෙළිදරව් කරනු ලබන තොරතුරුවලට අමතරව වෙනත් යම් තොරතුරු පිළියෙළ කිරීම සහ හෙළිදරව් කිරීම කරනු ලැබිය යුතු අතර; ඉහත සඳහන් තොරතුරුවලට අමතරව, නියෝග මඟින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු හෙළිදරව් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛන ඇතුළත් කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ අවසානයට පහත දැක්වෙන උපලේඛන ඇතුළත් කිරීම මඟින් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"පළමු උපලේඛනය

[5 (1) (උ) (ii) වන වගන්තිය]

<table>
<tr><td colspan="11">ආයෝජනය</td></tr>
<tr><td>ISIN*</td><td>සාධන පත්‍රයේ ස්වභාවය (උදා:- බිල්පත් බැඳුම්කර)</td><td>මිලදී ගැනීමේ දිනය</td><td>ප්‍රමාණය</td><td>නාමික අගය</td><td>ගැනුම් මිල</td><td>සලාක අනුපාතිකය</td><td>වෙළඳපල අගය / මිල**</td><td>කල්පිරීමේ දිනය</td><td>මිල දී ගැනීමේ දී කල්පිරීම් ඉපයීම (YTM)***</td><td>වෙනත් අදාළ තොරතුරු</td></tr>
<tr><td></td><td></td><td></td><td colspan="2"></td><td></td><td></td><td colspan="2"></td><td colspan="2"></td></tr>
<tr><td>කොටස් සංකේතය</td><td>සමාගමේ නම</td><td>කොටස් ගනුදෙනු</td><td colspan="2">මිල දී ගැනීමේ දිනය</td><td>ප්‍රමාණය</td><td>ගැනුම් මිල</td><td colspan="2">ප්‍රමාණ බර තබන ලද සාමාන්‍ය මිල (WVA)</td><td colspan="2">වෙනත් යම් අදළ තොරතුරු</td></tr>
<tr><td></td><td></td><td></td><td colspan="2"></td><td></td><td></td><td colspan="2"></td><td colspan="2"></td></tr>
</table>

දෙවන උපලේඛනය

<table>
<tr><td></td><td colspan="9">ආයෝජනය</td></tr>
<tr><td>ISIN*</td><td>සාධන පත්‍රයේ ස්වභාවය (උදා:- බිල්පත් බැඳුම්කර)</td><td>ප්‍රමාණය</td><td>නාමික අගය</td><td>සලාක අනුපාතිකය</td><td>වෙළඳපල වටිනාකම/ මිල **</td><td>කල්පිරීමේ දිනය</td><td>මිල දී ගැනීමේ දී කල්පිරීම් ඉපයීම (YTM)***</td><td>උපචිත ඉපයීම්/පාඩු</td><td>වෙනත් අදාළ තොරතුරු</td></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>කොටස් සංකේතය</td><td>සමාගමේ නම</td><td>කොටස් ගනුදෙනු</td><td colspan="2">මිල දී ගැනීමේ දිනය</td><td>ප්‍රමාණය</td><td>ප්‍රමාණ බර තබන ලද සාමාන්‍ය මිල (WVA)</td><td colspan="2">උපචිත වූ ඉපයීම්/පාඩු</td><td>වෙනත් යම් අදළ තොරතුරු</td></tr>
<tr><td></td><td></td><td></td><td colspan="2"></td><td></td><td></td><td></td><td colspan="2"></td></tr>
</table>

* ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය (ISIN)

** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළකරනු ලබන දෛනිකව/සතිපතා වන ආර්ථික දර්ශක මගින් තීරණය කරනු ලබන ආකාරයට

*** කල් පිරීමේ ඉපයීම් (YTM)

*සටහන:*

- භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර හෝ වෙනත් රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, සුරැකුම්පත් වර්ගය යොමු අංකය මගින් හඳුනාගනු ලැබිය යුතු ය.

- කොටස් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, සුරැකුම්පත් වර්ගය කොටස් මිලදී ගෙන ඇත්තා වූ සමාගමේ නමින් හඳුනාගනු ලැබිය යුතු ය.

- වෙනත් යම් සුරැකුම්පත් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, සුරැකුම්පත් වර්ගය, එම සුරැකුම්පත් නිකුත් කරන්නාගේ නම පැහැදිලිව සංජානනය වන ආකාරයෙන් හඳුනාගනු ලැබිය යුතු අතර, ඉහත සඳහන් වගුවලට සමීපතම ලෙස අනුරූපවන ගනුදෙනුවට අදාළවන වෙනත් සියලු තොරතුරු ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.